# ලංකාවේ ස්වදේශික කර්මාන්ත ස්ථාපනයෙහිලා අනගාරික ධර්මපාලතුමාගේ දායකත්වය

**එච්.එච්.එන්.එස්. හේවාවසන්[1], එස්.ඒ. දිල්හානි[2], ඊ.ඩබ්ලිව්.ඒ.එච්.සී. ගුණසිංහ[3]**
[1,2,3,]ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
[1*]*nadeerahewawasan@yahoo.com*, [2*]*anuruddhika.dilhani@yahoo.com*,
[3*]*hachagu@gmail.com*

ලාංකිකයන් තුළ බෞද්ධාගමික නැඹුරුව මෙන්ම ජාතිකත්වය පිළිබඳ හැඟීම් ඉස්මතු කරලීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ අයෙකු වශයෙන් අනගාරික ධර්මපාලතුමා හඳුනාගත හැකි ය. ලංකාවේ දේශපාලනික, සමාජීය, ආර්ථික, ආගමික සහ සංස්කෘතික අංශ කෙරෙහි එතුමා සිදුකළ බලපෑම එකී අංශවල උන්නතිය උදෙසා සෘජු දායකත්වයක් සැපයීමට සමත්විය. ඒ යටතේ ස්වදේශීය කර්මාන්ත ස්ථාපනය කිරීම සඳහා ධර්මපාලතුමාගෙන් ලැබුණේ ප්‍රායෝගික මැදිහත්වීමකි. එතුමා ඉන් අපේක්ෂා කළේ බටහිර ගැති මානසිකත්වයකින් පසු වූ ලාංකිකයන්ට ස්වශක්තිය පිළිබඳ වටහා දී, ස්වදේශීය නිෂ්පාදනවලින් යැපෙන්නට හුරුකොට දියුණු තත්ත්වයකට ලංකාව පත්කරවීමයි. ලංකාවේ ස්වදේශීය කර්මාන්ත ස්ථාපනයෙහිලා අනගාරික ධර්මපාලතුමා දැක්වූ ප්‍රායෝගික දායකත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අධ්‍යයන අරමුණ වූ අතර ඒ සඳහා අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් භාවිත කෙරුණේ මූලාශ්‍රය අධ්‍යයනය කිරීමයි. ජාතිකත්වය සහ ආගමික නැඹුරුව පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ ධර්මපාලතුමා ස්වදේශීය කර්මාන්ත ස්ථාපනය කිරීමේ කාර්යය සඳහා ලාංකිකයන් යොමු කරවමින් විවිධ වෘත්තීන් පිළිබඳ දැක්වූ අවධානය කෙබඳුවී ද සහ ඒ සඳහා එතුමා ගනු ලැබූ ප්‍රායෝගික ක්‍රියා පිළිවෙත කෙසේ වීද යන්න විමසා බැලීම මෙහිදී අධ්‍යයනය ගැටලුව බවට පත්වුණි. මෙම අධ්‍යයනයේදී දැකගත හැකි වූයේ ජාතිකත්ව හැඟීම් සහ බෞද්ධාගමික නැඹුරුව සහිතව ලාංකිකයන් ප්‍රබෝධමත් කිරීමෙන් පමණක් නොසෑහි ස්වදේශික කර්මාන්ත ඇතිකරමින් ආර්ථික අංශයෙන් ද සිංහලයන් ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙලක් ධර්මපාලතුමා විසින් ගෙනයනු ලැබූ බවයි. ඒ යටතේ පේෂ කර්මය, ගිනි පෙට්ටි, පිඟන් බඩු, සුවඳ විලවුන් සහ කඩදාසි ආදී කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ජපානය වැනි රටවලට ලාංකිකයන් පිටත් කිරීමට එතුමා කටයුතු කර තිබේ. එසේම ලාංකිකයන්ගේ පාරම්පරික අර්ථ ක්‍රමය වූ කෘෂිකර්මය පිළිබඳ අවධානය යොමු කළ ධර්මපාලතුමාගේ අපේක්ෂාව වූයේ කෘෂිකර්ම විද්‍යාලයක් ලංකාවේ ස්ථාපනය කිරීමයි. ඇමෙරිකාවේ හා බ්‍රිතාන්‍යයේ පැවති කාර්මික හා තාක්ෂණ අධ්‍යාපන ක්‍රමය වැනි ක්‍රමයක් මෙරටට අවශ්‍ය බව එතුමාගේ විශ්වාස විය.

ප්‍රමුඛ පද : අනගාරික ධර්මපාල, ස්වදේශික කර්මාන්ත, ජාතික ව්‍යාපාරය, වෘත්තීය පුහුණුව, තාක්ෂණික අධ්‍යාපනය